පැවරුම :- සතිය - 09 (2021-03-01 සිට 2021-03-07 දක්වා)

ඒකකය 02 :- ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය බලය

ක්‍රියාකාරකම අංක 02 :- ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල ඉංග්‍රීසි බලය පිහිටුවීම

පැවරුම් අංක 02 :- පෙරදිග ඉන්දියා ඉංග්‍රීසි වෙළඳ සමාගමට මෙරට මුහුදුබඩ ප්‍රදේශ යටත් වීම.

හැඳින්වීම :- ඉංග්‍රීසීන්ට පෙර මෙරට මුහුදුබඩ ප්‍රදේශ අල්ලාගෙන සිටි ලන්දේසීන්ගේ මව් රට වූයේ ඕලන්දයයි. ප්‍රංශ විප්ලවයේ ප්‍රතිඵලයක් ලෙස ප්‍රංශය විසින් ඕලන්දය ආක්‍රමණය කොට එහි බලය අල්ලා ගත් හෙයින් ඕලන්ද පාලක පස්වෙනි විලියම් රජතුමා බ්‍රිතාන්‍යයන්ට පලා ගියේය. මෙසේ ඕලන්දයේ ප්‍රංශ පාලනයක් බිහි වූ හෙයින් ලන්දේසීන් සතු වූ ප්‍රදේශ ප්‍රංශවරුන් යටත්කර ගනී යැයි ඉංග්‍රීසීන් බිය විය. මෙහිදී උපක්‍රමශීලීව බ්‍රිතාන්‍යයන් කටයුතු කර ඇත.

සිසු උපදෙස් :-

*පියවර 01* පෙළ පොතෙහි පිටු අංක 25 - 28 දක්වා හොඳින් කියවා ගන්න.

*පියවර 02* පසුගිය සතියේ සටහන අවසන් වූ තැනින් ඉහත හැඳින්වීම සටහන් කර ගන්න.

*පියවර 03* පෙළ පොත කියවා පහත සඳහන් ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

**<u>ප්‍රශ්නාවලිය</u>**

1) කිච් ලිපිය යනු කුමක්ද?

2) කිච් ලිපිය මෙරට ලැබෙන සමයේ මෙරට පාලනය කළ ලන්දේසි ආණ්ඩුකාරවරයා?

3) බ්‍රිතාන්‍යයන් විසින් ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ යටත් කරගත් දිනය නම් කරන්න.

4) 1796 වර්ෂයේ සිට 1815 උඩරට රාජධානිය යටත් කරගැනීම දක්වා මුහුදුබඩ ප්‍රදේශ පාලනයේ කැපීපෙනෙන අවස්ථා දක්වන්න.

5) මදුරාසි පාලනය යනු කුමක්ද?

6) ද්විත්ව පාලනය යන්න හඳුන්වන්න.

7) 1797 මුහුදුබඩ ප්‍රදේශවල ඇති වූ කැරැල්ලට බලපෑ හේතු සාධක ලියා දක්වන්න.

8) එම කැරැල්ල පිළිබඳ සෙවීමට පත් කළ කොමිසම කුමක්ද?

9) ද්විත්ව පාලනය යටතේ මෙරටට පත්ව ආ ප්‍රථම ඉංග්‍රීසි ආණ්ඩුකාරවරයා කවුරුන්ද?

10) බ්‍රිතාන්‍යයන්උඩරට ආක්‍රමණයට යොමුවීමට බලපෑ හේතු සාධක හතරක් ලියා දක්වන්න.

**<u>පසුවැඩ</u>**

1) පහත තේමා පිළිබඳ කෙටි සටහන් නිර්මාණය කරන්න.
- ජෝන් ඩොයිලි
- උඩරට පැවති අභ්‍යන්තර බල අරගලය

සැකසුම :- උදාර අරවින්ද
ර/ කලවාන ජාතික පාසල
නිවිතිගල අධ්‍යාපන කලාපය